බොරලැස්ගමුව නගර සභාව
කොළඹ දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

-------------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුලි 24 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට බොරලැස්ගමුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

(අ) <u>**ගිණුම්කරණ අඩුපාඩු**</u>

| | ගිණුම්කරණ අඩුපාඩු | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | -------------------------- | --------------- | ------------------------ |
| (i) | පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.) විසින් මිලදී ගෙන සභාවට ලබා දුන් කම්පැක්ටර් රථය සඳහා මුද්දර ආදායමෙන් මාසික වාරිකය රු.390,000 බැගින් වාරික 03 ක් අයකර ඉතිරි මුද්දර ගාස්තු රු.38,830,000 ක් ලෙස ගිණුම් ගත කිරීමෙන් රු.1,170,000 ක් මුද්දර ආදායම අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කල යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | 2018 වර්ෂයේ මිලදී ගත් රු.662,257 ක් වටිනා ලී බඩු හා කාර්යාල උපකරණ අයිතම 9 ක් ගිණුම්ගත නොකිරිම නිසා ස්ථාවර වත්කම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | 1999 සිට 2014 වර්ෂය දක්වා පරිත්‍යාග වශයෙන් ලැබුණු වාහන 05 ක විටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | පරිත්‍යාග වත්කම් තක්සේරු කර ගිණුම්ගත කල යුතුවේ. | පිළිගනිමි. 226-2026 දරණ කම්පැක්ටර් රථය මොරටුව නගර සභාවට ලැබුන වාහනයක් වන අතර |

| | | |
|---|---|---|
| | | ඉදිරියේදී නගර සභාවට භාර දීමට කටයුතු කරමි. |

(ආ) **<u>අසම්භාව්‍ය බැරකම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| අසම්භාව්‍ය බැරකම් ලෙස රු.76,850 දක්වා තිබුණද නඩු සම්බන්ධ විස්තර හා වර්තමාන තත්ත්වය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අසම්භාව්‍ය බැරකම්වල වර්තමාන තත්ත්වය හෙළිදරව් කල යුතුවේ. | පිළිගනිමි. ව්‍යාපාර බලපත්‍ර ගාස්තු සඳහා 2011 වර්ෂයට පෙර සිට නඩු පවරා ඇති අතර 2006 සිට අවසන් ගිණුමේ පමණක් මෙම මුදල සටහන් වේ. |

**(ඇ) <u>නොසැසඳුනු ගිණුම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාල ශේෂයන් ඒවාට අදාළ උපයෝගී ලේඛන/වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රකාශනවල රු. 4,676,487 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී විවිධ තැන්පත්. කඩ කුලී හිඟය, ව්‍යාපාර බදු ණයගැති හා සේවක ණය නිවැරදි කරමි . |

(ඈ) **<u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම.</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| අසම්භාව්‍ය බැරකම් රු. 76,850 ක් සඳහා උපලේඛන හා පෙර ගෙවුම් අත්තිකාරම් රු. 10,000 ක් සඳහා රිසිට්පත ද වීරී පහන් කණු විධිමත්ව අංකනය කර ඒ පිළිබඳ විස්තර දැක්වෙන ලේඛනයක් ද නගර සභාවට අයත් සුසාන භූමි 03 හි වපසරිය හා අයිතිය තහවුරු කර ගැනිමට අදාල ඔප්පු, සැලසුම් පවරා ගැනීම හෝ මිලදී ගැනීමට අදාල තොරතුරු ද විගණනයට ඉදිරිපත් නොවිය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

1.4 **අනුකූල නොවීම.**

1.4.1 **නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| XLVII වන පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්තිය | ණය ශේෂ නිරවුල් නොකරන නිලධාරින්ට විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | XLVII වන පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදි අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| i. මු.රෙ.571 | වර්ෂ 02 ක් ඉක්ම වූ රු.1,271,287 ක තැන්පතු සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පිළිගනිමි.නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| ii. මු.රෙ.880,881,891(1) හා රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරිය | ඇප තැබිය යුතු නිලධාරින්ගෙන් ඇප තැන්පත් ලබාගෙන නොතිබූ අතර ඇප ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මු.රෙ.880,881,891(1) හා රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනත අනුව කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. 2019 වර්ෂය තුල අවශ්‍ය කටයුතු සිදු කර ඇත. |
| iii. මු.රෙ. 1646 | සභාවට අයත් වාහන 03 ක ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි. | මු.රෙ. 1646 ප්‍රකාරව කටයුතු කල යුතුය. | පිළිගනිමි. ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) වෙනත් චක්‍රලේඛ | | | |
| පළාත් පාලන කොමසාරිස්ගේ 2012 ජුලි 11 දිනැති චක්‍රලේඛ අංක WP/LGD/ 01/ 2012 හි XXI ඡේදය | අනවසර ඉදිකිරීම් හා ගොඩකිරීම් සම්බන්ධව ත්‍රෛයිමාසික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛයේ XXI ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී වාර්තා සකස් කරමි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 39,245,030 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 67,215,767 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| | **'000** | **'000** | **'000** | **'000** | **'000** | **'000** | **'000** | **'000** |
| **වරිපනම් හා බදු** | 26,525 | 25,772 | 22,760 | 16,872 | 26,700 | 24,829 | 12,364 | 12,465 |
| **කුලී** | 1,961 | 990 | 1,042 | 178 | 1,426 | 935 | 800 | 135 |
| **බලපත්‍ර ගාස්තු** | 702 | 2,041 | 2,118 | 202 | 512 | 377 | 377 | - |
| **වෙනත් ආදායම්** | 48,431 | - | 51,962 | 2,026 | 47,027 | 37,640 | 6,144 | 31,496 |

#### 2.2.2 <u>වරිපනම් හා බදු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | --------------------------- | --------------- | ------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා බිල් කිරීම් රු.25,771,666 ක් වුවද ඉන් රු.10,805,622 ක් හෙවත් සියයට 41.93 ක් වර්ෂය තුල අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | බිල් කිරීම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. දේපළ තහනම් කිරීමේ නිලධාරීන් මාර්ගයෙන් අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ඉකුත් වර්ෂය අවසානයට වරිපනම් ණයගැති ශේෂය රු.13,973,105 ක් වුවද ඉන් වර්ෂය තුලදී රු.6,892,052 ක් පමණක් අයකරගෙන තිබුණි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.16,871,802 ක් වූ අතර ඉන් රු.50,000 ක් ඉක්මවූ හිඟ වරිපනම් ඒකක 10 ක් සඳහා රු.668,081 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. අය කිරීමට ඇති මුදල රු.349,810 කි. 02 ක් කපා හැරීමට යවා ඇති අතර එම මුදල රු.121,865 කි. 02ක් කපා හැරීමට යැවීමට ඇත.එම මුදල රු.144,977 කි.01 ක් අයකර ගෙන ඇත. එම මුදල රු.51429 කි. |
| (ඈ) | දේපල වර්ෂ 5 කට වරක් තක්සේරු කර වරිපනම් බදු අයකල යුතු වුවද සභාව විසින් 2009 වර්ෂයෙන් පසු දේපල තක්සේරු කර නොතිබුණි. | දේපල වර්ෂ 5 කට වරක් තක්සේරු කල යුතුවේ. | පිළිගනිමි. තක්සේරු කිරීම සඳහා තක්සේරු නිලධාරීන්ට ලිඛිතව දැනුවත් කර ඇති අතර ඔවුන්ගේ ප්‍රමාදය ඊට බලපා ඇති බව ප්‍රකාශ කරමි. |
| (ඉ) | රු.193,407 ක් වූ අයකරගත නොහැකි වරිපනම් බදු මුදල් කපා හැරීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් නිර්දේශකර තිබුණද පලාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මේ දක්වා ලැබී නොතිබුණි. | පලාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලැබිය යුතුවේ. | පිළිගනිමි. සහා අනුමැතිය සමග නැවත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

2.2.3 <u>කුලී</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | --------------------------- | --------------- | ------------------------- |
| (අ) | කඩකුලී ගිවිසුමෙහි කොන්දේසි අංක 02 අනුව කුලිය ගෙවීම මසකට අධික කාලයක් ප්‍රමාද වුවහොත් කඩකාමරයේ අයිතිය අහිමිවන බව සඳහන් වුව ද කඩකාමර 12 කින් මාස 03 සිට 15 දක්වා කාලයක් රු.147,433 ක කඩකුලී අය වී නොතිබුණද එසේ කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. කඩ හිමියන් දැනුවත් කර ඇති අතර මේ වන විට රු.98,775 ක් අය කර ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගිවිසුමෙහි කොන්දේසි අංක 12 සහ 1980 දෙසැම්බර් 31 දිනැති හා අංක 1980/46 දරන පලාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව වසර 05 කට වරක් කඩ කුලිය සංශෝධනය කළ යුතු වුවද 2009 වර්ෂයෙන් පසු ගාස්තු ප්‍රතිශෝධනය කිරීමක් හෝ ගිවිසුම් අලුත් කිරීමක් සිදු කර නොතිබුණි. | ගිවිසුම් කොන්දේසි හා චක්‍රලේඛ අනුව කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇත. සංශෝධනය කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | කොන්දේසි අංක 22 අනුව බදු ගැණුම්කරු විසින් කඩ කාමරය හෝ කොටසක් තවත් අයෙකුට විකිණීම,පැවරීම,අතුරුබදු දීම හෝ අවසර නොමැතිව ඉවත් වීම හෝ නොකළ යුතු වුව ද කඩ කාමර 15 ක් අතුරු බදු දී තිබුණි. | ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී කඩ හිමියන් දැනුවත් කර නිවැරදි කරමි. |
| (ඈ) | වසා දමා ඇති කඩ කාමර 02 ක රු.76,793 ක හිඟ කඩකුලිය වසර 06 ක් ගත වුවද අයකර නොතිබූ අතර එම හිඟ මුදල ඉදිරියට ගෙනවිත්ද නොතිබුණි. | හිඟ කඩකුලිය ඉදිරියට ගෙන අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. ලේඛනගත කිරීමේදී සිදු වූ දෝෂය නිවැරදි කරමි. කඩකාමර අංක 9 සඳහා නඩු පවරා ඇත. |

2.2.4 <u>බලපත්‍ර ගාස්තු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | -------------------------- | --------------- | ------------------------ |
| (අ) | 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල රු.189,400 ක හිඟ ව්‍යාපාර බදු සමාලෝචිත වර්ෂය තුලද අයකරගැනීමට අපොහොසත් වී තිබුණි. | හිඟ ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. නඩු පවරා ඇත. අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | රු.36,000 ක හිඟ බදු අයකර ගැනීම සඳහා ව්‍යාපාර 39 කට නඩු පවරා තිබුණද ප්‍රවර්තන වර්ෂය තෙක් හිඟ බදු අයකර ගෙන නොතිබුණි. | හිඟ ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. මෙම ව්‍යාපාර සඳහා නඩු පවරා ඇති නිසා නඩු තීන්දුව ලැබෙන තෙක් අය කර ගැනීමට නොහැකි වී ඇත. |

2.2.5 <u>මුද්දර ගාස්තු ආදායම</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | -------------------------- | --------------- | ------------------------ |
| (අ) | ප්‍රවර්තන වර්ෂයේ මුද්දර ණයගැතියන් ලෙස රු.10,000,000 ක් පමණක් ජංගම වත්කම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | පිළිගනිමි. ගිණුම් ගත කිරීමේදී අතපසු වීමත් සිදු වී ඇත. ඉදිරියේදී එය නිවැරද කිරිමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නුගේගොඩ දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2015 වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.53,341,324 ක් ලෙස හඳුනා ගෙන තිබුණද 2016, 2017 සහ 2018 වර්ෂ සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන නොතිබුණි. | 2016, 2017 සහ 2018 වර්ෂ සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගත යුතුවේ. | පිළිගනිමි. 2016 මාස 06 ක මුද්දර ගාස්තු මේ වන විට හඳුනාගෙන ඇත. |
| (ඇ) | කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2015 සැප්තැම්බර් දක්වා ද අවිස්සාවෙල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2015 අගෝස්තු දක්වා ද මුද්දර ගාස්තු ලැබී තිබුණ නමුත් ඉන් පසු ආදායම් ලබා ගෙන නොතිබුණි. | මුද්දර ගාස්තු ආදායම අයකර ගත යුතුවේ. | පිළිගනිමි. 99%ක් පමණ දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට අයත් වන අතර අවිස්සාවේල්ල කාර්යාලයෙන්ම මුද්දර ගාස්තු සාරාංශ වාර්තාව සකස් කර එවනු ලැබේ. |

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1. **<u>කාර්ය සාධනය</u>**

(අ) **<u>ක්‍රියාකාරී සැලැස්ම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යය මණ්ඩල සඳහා වාර්ෂිකව පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.150,000 වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කලද කිසිම නිලධාරියකුට පුහුණුව ලබා දී නොතිබුණි. | නිලධාරින් වාර්ෂිකව පුහුණු කිරිම කල යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී කටයුතු කරමි. |

(ආ) **<u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| i. | 2018 වර්ෂය තුල සභා බල ප්‍රදේශය තුල වෙන් නොකරන ලද කසළ ටොන් 7,815.82ක් හෙවත් මුළු කසළ ප්‍රමාණයෙන් සියයට 72 ක් වු අතර කසළ එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය නොකිරීම නිසා මිශ්‍ර අපද්‍රව්‍ය වෙනුවෙන් රු.7,280,468 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. | කසළ එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය කල යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී කසළ වෙන් කිරීමට කටයුතු කරමි වර්තමානය වන විට 40% දක්වා අඩුවී ඇත. |

| | | | |
|---|---|---|---|
| ii. | කසළ කළමනාකරණ ව්‍යාපෘතියෙන් රු.50,000 ක ආදායමක් වාර්ෂික අයවැය මගින් ඇස්තමේන්තු කර තිබුණද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | කසළ කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල යුතුවේ. | පිළිගනිමි.ඉදිරියේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | -------------------------- | --------------- | ------------------------- |
| (අ) | පුස්තකාල පොත් සමීක්ෂණයේ දී පරිග්‍රහණ ලේඛනයේ ඇති ඉදිරිපත් නොකල පොත් සංඛ්‍යාව 673 ක් වූ අතර පෙර වර්ෂයට සාපේක්ෂව මෙය දෙගුණයක් විය. | සමීක්ෂණය සඳහා සියළුම පොත් ඉදිරිපත් කල යුතුවේ. | පිළිගනිමි.නැවත සමීක්ෂණයක් සිදු කිරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | පුස්තකාලයකට සුදුසු පරිසරයක් හා ආරක්ෂාව පිළිබඳ සැලකිළිමත් නොවී නව පුස්තකාල ගොඩනැගිල්ල ගැනීමට කටයුතු කිරිම නිසා පාඨකයන් සංඛ්‍යාව අඩු වි ඇති බවත් පාඨකයන්ට උපරිම ඵලදායිතාවයක් ලබා ගැනිමට නොහැකි වි ඇති බවත් නිරික්ෂණය විය. | පුස්තකාල ස්ථාපිත කිරිමේදි සුදුසු පරිසරයක් හා පාඨකයන්ගේ ආරක්ෂාව පිළිබඳ සැලකිළිමත් විය යුතුවේ. | පිළිගනිමි. ඵලදායීතාවය වැඩි කර ගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බව දන්වා සිටිමි. |

3.3.මානව සම්පත් කළමනාකරණය
-----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | -------------------------- | --------------- | ------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 13 ක් පිරවීමට අපොහොසත් වී තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. පුරප්පාඩු පිරවීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02 ක පුරප්පාඩු පැවතීම හේතුවෙන් සභාවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. පුරප්පාඩු පිරවීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ඇ) | විශ්‍රාම ගිය හෝ ස්ථාන මාරු වී ගිය නිලධාරීන් තිදෙනෙකුට ලබාදුන් රු.13,896 ක් වූ ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ නිරවුල් කරගත යුතුවේ. | පිළිගනිමි. කපාහැරීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි . |
| (ඇ) | සේවය හැර ගිය නිලධාරීන් 03 දෙනෙකුගේ උත්සව සහ විශේෂ ණය ශේෂ රු.23,100 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ නිරවුල් කර ගැනිමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරමි |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වැඩ තහනමකට ලක් වූ නිලධාරින් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.338,592 ක ආපදා ණය ශේෂ ඇපකරුවන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණයකරුවන් ණය පැහැර හරින අවස්ථාවන්හි ඇපකරුවන්ගෙන් අය කර ගැනීමට කටයුතු කල යුතුවේ. | නිලධාරීන් දෙදෙනෙකුගේ ඇපකරුවන්ගෙන් අයකිරීමට කටයුතු කරමි. අනෙක් නිලධාරියාට ඇපකරුවන් ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන ලදී. |

3.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | --------------------------- | --------------- | ------------------------- |
| (අ) | 2018 වර්ෂයේ බිම් කට්ටි හා ගොඩනැගිලි සැලසුම් සඳහා අයදුම්පත් 1031 ලැබී තිබුණද අයදුම්පත් 210 ක් අනුමත කර නොතිබුණි. | මහජන සේවා කඩිනමින් ඉටු කිරිමට වගබලා ගත යුතුවේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි 2008-2020 හි 14(1) අ වන උපවගන්තිය අනුව සැලසුම් අනුමත කිරීම සඳහා වූ අයදුම්පත ලියාපදිංචි කළ දින සිට සති අටක් (08) ක් ඇතුළත අනුමත කළ යුතු වුවත් ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම දින 102-228 ත් අතර කාල පරාසයක් ගත වී තිබුණි. | සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරිමට වග බලා ගත යුතුවේ. | පිළිගනිමි. අයදුම්පත්වල අඩුපාඩු නිවැරදි කිරීම සඳහා අයදුම්කරුවන් ඉදිරිපත් වීම ප්‍රමාද වීම මෙයට හේතු වන අතර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

3.5 <u>වත්කම් කළමනාකරණය</u>

3.5.1 <u>වත්කම් ලේඛනගත නොකිරීම.</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| --------------------------- | --------------- | ------------------------- |
| 2018 වර්ෂයේ මිලදී ගත් රු.480,237 ක් වටිනා භාණ්ඩ වර්ග 07 ක් ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි. | ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුලත් කල යුතුවේ. | පිළිගනිමි.ලේඛනයට ඇතුලත් කර ගැනීමට කටයුතු කරමි. |

3.5.2 **නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| මිනි කම්පැක්ටර් රථයට අළුතින් ටැංකියක්, නව වැසියක් හා පින්තාරු කිරීම සඳහා රු.1,210,000 මුදලක් වැය කර තිබුණද සවිකර ඇති ටැංකිය පැස්සුම් කර සකස් කරන ලද පැරණි ටැංකියක් විය. | වැඩ හා සේවා කඩිනමින් හා කාර්යක්ෂමව නිසි ප්‍රමිතියෙන් යුක්තව ඉටු කර යුතුවේ. | පිළිගනිමි. මුදල් ගෙවීමකින් තොරව නැවත අලුත්වැඩියා කිරීමට මේ වන විට සිදු කරමින් පවතී. |

3.5.3 **නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| දීර්ඝ කාලයක සිට අබලි තත්ත්වයේ පවතින වාහන දෙකක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණය කිරීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී වෙන්දේසියේ දමා අවශ්‍ය කටයුතු සිදු කරමි. |

3.5.4 **වාර්ෂික භාණ්ඩ / තොග සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අනුව ප්‍රයෝජනයට ගත නොහැකි රු.104,181 ක් වටිනා භාණ්ඩ වෙන්දේසි කිරීමට නිර්දේශ කර ඇතත් එසේ කර නොතිබුණි. | වෙන්දේසි කිරීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. වෙන්දේසි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

3.5.5 **කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- | --- |
| (අ) | ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේ දී මාර්ග ගාස්තු උපලේඛනය (HSR) භාවිතා කර තිබුණු අතර 2018 ඔක්තෝම්බර් 25 දින බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ 2018/2019 වර්ෂ සඳහා එම ගාස්තු සංශෝධනය කර තිබුණද සංශෝධනයට පෙර ගිවිසුම් ගත ව්‍යාපෘති 04 ක ඇස්තමේන්තු සඳහා සංශෝධිත ගාස්තු භාවිතා කර ගෙවීම් කර තිබුණි. | මාර්ග ගාස්තු සංශෝධනය කල දිනයන් අනුව හා ව්‍යාපෘති දිනයන් හා ඇස්තමේන්තු පිළියෙල කල යුතුවේ. | පිළිගනිමි. 2018 04.11 දින සිට ක්‍රියාත්මක මාර්ග මිල ගණන් ලේඛණය අනුව ඒකක මිල භාවිතා කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රු.1,612,387 ක් වැයකර පුද්ගලික මාර්ග 03 ක් සංවර්ධනය කර තිබුණද සභාවට පවරා ගැනීම සම්බන්ධයෙන් 2018 පෙබරවාරි 20 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | සභාවට පවරා ගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. පවරා ගැනීමට කටයුතු කර ඇත. |
| (ඇ) | 2018 සැප්තැම්බර් 18 දිනට ලබා දුන් තොරතුරු අනුව සභාවට පවරා ගත් මුළු මාර්ග සංඛ්‍යාව 503 ක් වුවද ඉන් ගැසට් කරන ලද මාර්ග සංඛ්‍යාව 491 ක් විය. | ගැසට් කිරීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. නව මාර්ග 25 ක් පමණ නගර සභාවට පවරා ගත් පසු එකවර ගැසට් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඈ) | කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කටුවාවල නිලම්මහර ප්‍රධාන පාරේ ආසිරි උයනේ මීටර් 189 ක් දිග පොදු අතුරු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.1,196,483 ක මුදලක් වැයකර තිබුණද සංවර්ධනය කල මාර්ගයේ තැනින් තැන වලවල් සෑදී ගල් මතු වී තිබුණි.දෙවන වරට තාර දැමීම සිදුකලාද යන්න තහවුරු නොවීය. | උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායිතාවයෙන් යුක්තව කර්මාන්ත ඉටුකල යුතුවේ. | පිළිගනිමි. දෙවන වර තාර දමා ඇති අතර රැඳවුම් මුදල නිදහස් කර නොමැත. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| --------------------------- | --------------- | ------------------------- |
| මහජන සුභසාධනය සහ අත්‍යවශ්‍ය කටයුතු සඳහා වැය විෂයයන් 05 ක් සඳහා වෙන්කර තිබූ රු.3,431,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කල යුතුවේ. | පිළිගනිමි. 2019 වර්ෂයේ අදාල කටයුතු සිදු කරමින් පවතී. |